## ඉදිරිපත් කිරීම

# බහු සංස්කෘතික කටයුතු ව්‍යාපෘතිය

බහු සංස්කෘතික කටයුතු ව්‍යාපෘතිය හොංකොං හී ජීවත් වන විවිධ ජන වාර්ගික කණ්ඩායම් අතර අන්තර් සංස්කෘතික අවබෝධය සහ ඇගයීම ප්‍රවර්ධනය කිරීම සඳහා ඇති කරගත් ප්‍රජා වැඩසටහනකි. මේ පිළිබඳව වැඩිදුරටත් කරුණු නොමිලේ ලබාගැනීම සඳහා කරුණාකර අපගේ http://arts.cuhk.edu.hk/~ant/knowledge-translfer/multiculturalism-inaction-index.html වෙබ් අඩවියට පිවිසෙන්න. අපි ඔබේ සියලු විමසීම් සාදරයෙන් පිළිගනිමු.

## හොංකොංහී වෙසෙන දකුණු ආසියානුවන්

දකුණු ආසියානු යනු ඇෆ්ගනිස්තානය, බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මාලදිවයින, නේපාලය, පකිස්තානය සහ ශ්‍රී ලංකාව ඇතුළු ආසියාවේ දකුණු දිග පිහිටි රටවල් හඳුන්වන භූගෝලීය සංකල්පයකි.

| ජනවර්ගය | සංඛ්‍යාව | ප්‍රතිශතය |
|---|---|---|
| ඉන්දියානු ජාතිකයින් | 28,616 | 0.4% |
| පකිස්තාන ජාතිකයින් | 18,042 | 0.3% |
| නේපාල ජාතිකයින් | 16,518 | 0.2% |
| වෙනත් ආසියානු ජාතිකයින් (බංග්ලාදේශ සහ ශ්‍රී ලාංකිකයින් ඇතුළුව) | 7083 | 0.09% |
| මූලාශ්‍රය 2011 සංගණනය | | |

2011 වසරේ කරන ලද සංගණනයන්ට අනුව හොංකොං ජනගහණයෙන් 1% ක් දකුණු ආසියානු ජාතිකයින් බව පෙනී යයි.

## ඉතිහාසය

දකුණු ආසියානුවන් මුලින්ම හොංකොං හී වාසයට ආවේ 19 වැනි සියවසේදීය. ඔවුහු පොලිස් භටයින්, සොල්දාදුවන් සේම තේ, රෙදිපිළි සහ ආභරණ වෙළෙන්දන් සහ වෙනත් වෙළඳාම් කරුවන් ලෙසින් ආ ඉන්දියානු ජාතිකයින්ය. 1974 දී පකිස්තානයටද, 1971 දී බංග්ලාදේශයටද නිදහස ලැබීමත් සමගම පකිස්තාන සහ බංග්ලාදේශ ජාතිකයින්ද හොංකොං හී වාසයට පැමිණෙන්නට වූහ.



Copyright © Multiculturalism in Action Project 2016 Language: Sinhalese



හිටපු ගුර්කා භටයින් හොංකොං අනුස්මරණ දිනය සමරමින්

හොංකොං හී වාසය කරන නේපාල ජාතිකයින්ගේ ඉතිහාසය 1948 වසරේ **බ්‍රිතාන්‍ය** හමුදාවේ ගුර්කා හේවා **කණ්ඩායම ස්ථානගත කිරීම** දක්වා ඈතට විහිදී යයි. ඔවුන්ගේ **ප්‍රධාන** රාජකාරි හතර වූයේ **දේශසීමා** පාලනය, **අභ්‍යන්තර** ආරක්ෂාව, පිපිරුම් උපකරණ බැහැර **කිරීම සහ රේගු කටයුතු සඳහා සහය වීමයි.** "***Trailwalker***" සහ "***Hike for Hospice*** " **යන සමාජ සේවාවන්**ගුර්කා හේවා කණ්ඩායම් විසින් ආරම්භ කරන ලදී.



ශ්‍රී ලාංකික ආහාර

අද වන විට දකුණු ආසියානු කාන්තාවන් සහ පුරුෂයින් හොංකොං හී විවිධ රැකියාවන්වල නිරත වෙති. මේ රැකියා පරාසය ගණකාධිකාරවරුන්ගේ **හා** මලල **ක්‍රීඩකයින් සිට ව්‍යවසායකයින්, නිවාස අලූත්වැඩියා කරන්නන්,** ගුරුවරුන්, ගොඩනැගිලි ඉදිකරන්නන්, නීතිඥයින් සහ බැංකුකරුවන් දක්වා විහිදී යයි. දකුණු ආසියානු ආහාර, **සෞඛ්‍යය අභ්‍යාසයන්** (**යෝග ව්‍යායාම්** ආදිය) සහ ආගමික උත්සව, හොංකොං දේශය බහු සංස්කෘතික සහ **දීප්තිමත්** පුරවරයක් බවට පත්කරමින් දේශීය ජන ජීවිතයේ සහ අපගේ දේශීය උරුමයේ අංගයක් බවට පත්වී තිබේ.

## <u>අනුකලණය</u>

දකුණු ආසියානුවෝ හොංකොං දේශය සිය වාසස්ථානය බවට පත් කරගෙන දේශීය ජීවන රටාවට හුරු වී සිටිති. සිම් ෂා සුයි, ජෝර්ඩන්, යවු මා තෙයි සහ යුන් ලෝන්ග් ආදී ප්‍රදේශවල දකුණු ආසියානු සිල්ලර වෙළඳ සල් සහ අවන්හල් දැකගත හැකිය. ඒ බොහෝ අවන්හල්වලට චීන නමක් ඇති අතර සියලු ජන වාර්ගිකයින්ට පහසුකම් සලසමින් ඒවායේ චීන ආහාරද සපයනු ලැබේ.

බොහෝ දකුණු ආසියානු උත්සව සහ **සාම්ප්‍රදායන්** හොංකොං හීදී දැකගත හැකිය. උදාහරණයක් ලෙස, ඉන්දියානු සහ බංග්ලාදේශ හින්දු ආගමිකයනින් විසින් දුර්ගා පූජාව සමරනු ලබන අතර නේපාල ජාතික ගුරුන්ග් බැතිමතුන් විසින් ලොසාර් (නව අවුරුද්ද) සමරනු ලබයි.



**Copyright © Multiculturalism in Action Project 2016**



දුර්ගා පූජාව යනු හොංකොං හී සමරනු ලබන හින්දු උත්සවයකි



*Kam Shan Country Park* හීදී ලොසාර් (ගුරුන්ග් නව අවුරුද්ද) සමරන අයුරු

හොංකොං හී **අධ්‍යාපන** සංවර්ධනයට, **ප්‍රජා සෞඛ්‍යය** සේවාවන්ට සහ ගමනාගමනයට දකුණු ආසියානු ජනහිතකාමීන් සිය දායකත්වය ලබාදී තිබේ. හොංකොං සරසවිය, බෙලිලියොස් පාසල, රතොන්ජී රෝහල සහ ස්ටාර් ෆෙරි **ආදී ආයතන ආරම්භ කිරීමේදී මෙලෙස ඔවුන්ගේ දායකත්වය ලබාදී ඇත.**

## <u>අභියෝග</u>

පොදුවේ ගත් කල, හොංකොං හී වාසය කරන දකුණු ආසියානුවන්ට ඇති **ප්‍රධානම** අභියෝගය චීන භාෂාව උගෙන ගැනීමයි. බොහෝ දෙනා ඔවුන්ගේ නිවෙස්වල දේශීය භාෂාව භාවිතා කරන බැවින් චීන භාෂාව පුහුණු වීමට ඇත්තේ ඉතා අල්ප වූ අවස්ථාවකි. ඇතැමකු **ව්‍යක්ත** ලෙස කැන්ටනීස් භාෂාව කතා කළද, චීන භාෂාවෙන් කියැවීමට සහ ලිවීමට **නොහැකි වීම** රැකියාවලදී සහ උසස් **අධ්‍යාපනය** ලබාගැනීමේදී තවමත් විශාල බාධාවක් වී තිබේ.

මහජන සේවාවන් තුළ ඇති සංස්කෘතික සංවේදීතාවයේ **අඩුකම** හේතු කොටගෙන තමන්ට අඩු සැලකිල්ලක් දක්වනවාය යන හැඟීමක් දකුණු ආසියානු තුළ ඇති විය හැකිය. උදාහරණයක් ලෙස, හොංකොං හී **සෞඛ්‍යය** සේවාවන් සුළු ජනවාර්ගික ජනතාවගේ ආගමික සහ සංස්කෘතික **අවශ්‍යතාවයන්** පිළිබඳව මීට වඩා දැනුවත් වී තිබීම අවශ්‍යය. **බෞද්ධාගමික කටයුතු සඳහා සුදුසු සිද්ධස්ථානයක් නොමැති වීම ශ්‍රී ලාංකිකයින්ට අභියෝගයක් වී ඇත.** අලුත් මස් ලබාගැනීම සඳහා මෙහි ඇත්තේ ඉතා සුළු වෙළඳසල් ප්‍රමාණයක් වන අතර සියලු අවන්හල්වල හලාල් **ක්‍රමයට** සැකසූ ආහාර සපයනු නොලබනු බැවින් මුස්ලිම් ජනතාවට අමතර අපහසුතාවන්ට මුහුණ දීමට සිදුවනු ඇත.


Copyright © Multiculturalism in Action Project 2016

# <u>කබඩි සමග විනෝද වෙමු</u>

කබඩි යනු දකුණු ආසියාව පුරා **ප්‍රචලිත** සාම්ප්‍රදායික ගැමි **ක්‍රීඩාවකි**. දැන් එය ආසියානු **ක්‍රීඩා** උළෙලේ නිල **ක්‍රීඩා** අංගයක් බවටද පත්වී තිබේ. කබඩි යන්නෙහි අර්ථය “ජීවනය ඇරඹීම” යන්නයි. මෙය **කඩිසරබව**, සහයෝගය සහ උපාය ඥානය පදනම් කරගත් **ක්‍රීඩාවකි**.

මේ **ක්‍රීඩාව** කරනු ලබන්නේ සාමාජිකයින් 7 දෙනා බැගින් සිටින කණ්ඩායම් දෙකක් විසිනි.**ආක්‍රමණිකයා** යනුවෙන් හඳුන්වන එක **ක්‍රීඩකයකු** විරුද්ධ කණ්ඩායමේ සිටින සාමාජිකයින්, එනම් වළක්වන්නන් ඇල්ලීම සඳහා මැද රේඛාව පසු කර යා යුතුය. **ආක්‍රමණිකයෝ** රේඛාව පසු කරන අතරේ නොනවත්වාම “කබඩි, කබඩි . . .” යනුවෙන් පවසති. හති වැටෙන්නට පෙර ඔවුහු යළිත් ඔවුන්ගේ කණ්ඩායම වෙත යා යුතුය.

තමන්ගේ කණ්ඩායම වෙත යාමට පෙර වළක්වන්නන් විසින් **ආක්‍රමණිකයකු** අල්ලාගනු ලැබුවොත්, වළක්වන්නන්ගේ කණ්ඩායමට එක ලකුණක් ලැබෙයි. **ආක්‍රමණිකයින්**ට සාර්ථකව සිය කණ්ඩායම වෙත යළි යාමට හැකි වූවොත්, ඔවුන් විසින් අල්ලාගනු ලැබූ වළක්වන්නන්ගේ **සංඛ්‍යාවට** අදාලව ඔවුන්ට ලකුණු හිමි වෙයි. අල්ලාගනු ලැබූ **ක්‍රීඩකයකු ක්‍රීඩාවෙන් ඉවත්** කරනු ලැබේ. ඉතා යුහුසුළුව සිදුවන මෙම **ක්‍රීඩාව** නරඹන්නන් අතරේ



පකිස්ථාන සහ චීන ජාතික තරුණ පිරිසක් කබඩි ක්‍රීඩාවේ යෙදෙන අන්දම

***ඔබගේ කබඩි දක්ෂතාදැරගා බලන්න !***

***එන්න අප සමග ක්‍රීඩා වාරයක යෙදෙන්න !***

***ඔබටත් ඒ සඳහා හැකියාවක් ඇත්දැයි දැනගන්න !***

**FUN with Interculturalism** is funded by the Equal Opportunities Commission, and supported by Department of Anthropology, Arts Faculty, Institute of Future Cities, and Office of Research and Knowledge Transfer Fund, The Chinese University of Hong Kong.

**Copyright © Multiculturalism in Action Project 2016** **Language: Sinhalese**